# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1101/14 — 1999 ඔක්තෝබර් 15 වැනි සිකුරාදා — 1999.10.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 6/81

**1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමේ) පනත**

1998 අංක 8 දරන පනතින් සංශෝධිත 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ 15 වන වගන්තිය යටතේ සමාජ සේවා අමාත්‍යවරයා විසින් සාදන ලබන නියෝග.

සමාජසේවා අමාත්‍ය.

1999 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 1999 අංක 01 දරන ස්වෙච්ඡා සමාජසේවා සංවිධාන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ පනතේ 4 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් ම සාරාංශකුලව මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව විය යුතු අතර, මෙහි දෙවන උපලේඛනයේ නියමිතව දක්වා ඇති ලේඛන ද එම ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. සෑම ලියාපදිංචි කළ ස්වෙච්ඡා සමාජ සේවා සංවිධානයක්ම පහත සඳහන් ලිපි ලේඛන තබාගත යුතු අතර පවත්වාගෙන යා යුතුය. –

- i. බැංකු ගිණුම් ඇතුළත් මුදල් පොත ;
- ii. අත් මුදල් පොත
- iii. ප්‍රධාන ලෙජරය ;
- iv. ප්‍රධාන ජර්නලය ;
- v. සාමාජික ගාස්තු ලෙජරය ;
- iv. ණය කරුවන්ගේ සහ ණය හිමියන්ගේ ලෙජරය ;
- vii. උප පත්‍රිකා පොත් ;
- viii. කුවිතාන්සිය නිකුත් කිරීමේ ලේඛනය ;
- ix. වත්කම් ලේඛනය ;
- x. කාරක සභා වාර්තා පොත් ;
- xi. සාමාජික ලේඛනය ;
- xii. පත්වීම් ලිපි ඇතුළුව සාමාජිකයන්ගේ , කාර්ය මණ්ඩලයේ, නිලධරයන්ගේ සහ සේවකයන්ගේ විස්තර ;
- xiii. අදාළ පනත් සහ නියෝග ඇතුළත් ලිපි ගොනු .

I A — H-5252—1,315(99/10)

**පරීක්ෂණ මණ්ඩලය :**

4. පනතේ II වන වගන්තිය යටතේ පත් කරන ලද (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන ) පරීක්ෂණ මණ්ඩලය විසින්, යම් ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක අරමුදල්වල වංචාවක් හෝ වැරදි පරිහරණයක් පිළිබඳ යම් චෝදනාවක් සම්බන්ධයෙන් එය වෙත යොමු කරනු ලබන යම් කාරණයක්, මෙම නියෝගවලට අනුකූලව, අසා තීරණය කරනු ලැබිය හැකි ය.

5. අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා ලිඛිතව බලය පවරනු ලබන සමාජසේවා අමාත්‍යාංශයේ නිලධරයෙක් මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතු ය. මණ්ඩලයේ උපදෙස් මත ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතු ය. මණ්ඩලයේ උපදෙස් මත ලේකම්වරයා මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක්ම, දැන්වීමක්ම හෝ ලේඛනයක්ම අත්සන් කරනු ලැබිය යුතුය.

6. (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන ) යම් ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයකට විරුද්ධව කරනු ලබන කිසිදු පැමිණිල්ලක්, ඒ පැමිණිල්ල ඒ සංවිධානයට විරුද්ධව චෝදනා කරනු ලබන සිද්ධි හෝ කරුණු දක්වා සිටිමින් මණ්ඩලයේ සභාපතිවරයා වෙත එවනු ලබන ලිඛිත ප්‍රකාශයක් මාර්ගයෙන් ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, භාරගනු නොලැබිය යුතු ය.

7. (1) පනතේ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලය වෙත පැමිණිල්ලක් යොමු කරනු ලැබූ අවස්ථාවක දී, සභාපතිවරයා විමසා ලේකම්වරයා විසින් :-

(අ) පැමිණිල්ලෙහි චෝදනා කරනු ලැබ ඇති කරුණු සඳහන් කරමින් පැමිණිල්ල ලැබී ඇති බව වංචාවට හෝ වැරදි පරිහරණයට සම්බන්ධ වී ඇති බවට චෝදනා කරනු ලැබූ සංවිධානය වෙත දැනුම් දිය යුතු අතර පැමිණිල්ලෙහි චෝදනා කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් ඒ සංවිධානයට පිළිතුරු දීමට ඇති යම් කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන ලෙස ඒ සංවිධානයෙන් ඉල්ලා සිටිය යුතු ය.

(ආ) එම පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය සහ දිනය පිළිබඳ ලිඛිත දැන්වීම දින 14 කට පෙර පැමිණිලිකරුට සහ වග උත්තරකරුට භාර දිය යුතු ය.

(2) ලේකම්වරයා විසින් මණ්ඩලයේ රැස්වීම් කටයුතු පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

8. සිතාසි, සංවිධානයේ ලියාපදිංචි ලිපිනය වෙත යැවීමෙන් භාරදෙනු ලැබිය හැකි අතර, එසේ ප්‍රායෝගිකව කළ නොහැකි නම් එම සංවිධානයේ අවසන් වරට දැන සිටින ලිපිනය වෙත භාරදීම කළ හැකි ය.

9. සිතාසි භාරදෙනු ලැබූ සංවිධානය විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයෙක්, සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, සිතාසියේ භාවය පරිදි සාක්ෂි දීම හෝ අවශ්‍ය පරිදි සහ එම සංවිධානයේ සන්තකයේ හෝ බලය යටතේ ඇති ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. සාක්ෂිකරුවෙකුට තමා කැමති භාෂාවකින් සාක්ෂි දීමට අවසර ඇත.

11. පරීක්ෂණ මණ්ඩලයේ යම් පරීක්ෂණයක තීරණය සඳහා වූ සියලු කරුණු පැමිණ සිටින සහ ඡන්දය දෙ සාමාජිකයන්ගෙන් වැඩි දෙනෙකුගේ ඡන්දයෙන් තීරණය කරනු ලැබේ.

12. **මේ නියෝගවල -**
"පනත" යන්නෙන් 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණ කිරීම ) පනත අදහස් වේ.

### පළමුවන උපලේඛනය
(4 වන වගන්තිය )

1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම ) පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය.

1. සංවිධානයේ නාම :-
2. (අ) සංවිධානයේ වැඩ කටයුතුවල ස්වභාවය (සවිස්තර වාර්තාව වෙනම ඇමිණිය යුතුය ) :-
(ආ) පහත දැක්වෙන විස්තර ඇතුළුව අරමුණු -

1. දිළිඳුකම පිටුදැකීම
2. පරිසරය
3. ව්‍යවසාය, සංවර්ධනය හා පුහුණුව
4. පුහුණුව හා අධ්‍යාපනය
5. සෞඛ්‍ය හා සනීපාරක්ෂාව
6. පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය
7. ප්‍රජනන සෞඛ්‍යය
8. මානව හිමිකම්
9. ආපදා කළමනාකරණය
10. ග්‍රාම සංවර්ධනය
11. ළමා අයිතිවාසිකම් සුරැකීම
12. කාන්තාව හා සංවර්ධනය
13. ස්ත්‍රී/පුරුෂ සමානාත්වය
14. සහන සේවා
15. ඉතුරුම් හා ණය පහසුකම්
16. වෙනත්

3. ස්ථිර ලිපිනය :-
4. ප්‍රධාන සම්බන්ධීක පුද්ගලයා :-
5. පිහිටුවීමේ දිනය :-
6. සංවිධානයේ වර්ගය :-
7. රාජ්‍ය නොවන සංවිධානයේ කටයුතු ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-
8. සාමාජික සංඛ්‍යාව :-
9. විධායක කමිටුවේ සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් :-
10. විදේශ ආධාරය ඇත්නම් ඒවා ද ඇතුළුව ආදායම් මූලාශ්‍ර :-
11. සංවිධානයේ වත්කම් :-
12. වෙනත් තොරතුරු :-

.............................(ලේකම්ගේ නම ) වන මම.................................... (සංවිධානයේ නම ) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම ) පනතේ විධිවිධාන සහ එය යටතේ සාදන ලද නියෝග පිළිපැදීමට මෙයින් එකඟ වන අතර මෙම ඉල්ලුම්පත එකී පනතේ විධිවිධානවලට ද එය යටතේ සාදන ලද නියෝග වලට ද ස්වේච්ඡා සමාජ සේවා සංවිධානවල රෙජිස්ට්‍රාර්වරයා විසින් කලින් කළ නිකුත් කරන ලද උපදෙස් හා විධානවලට ද අනුකූලව යථාපරිදි සම්පූර්ණ කොට ඉදිරිපත් කරනු ලැබ ඇති බවට මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති සියලු තොරතුරු මගේ දැනුම අනුව සත්‍ය හා නිවැරදි බවට ද සහතික කරමි.

ලේකම්,
(ස්වේච්ඡා සංවිධානයේ මුද්‍රාව)

.....................................
වටිනාකම ඇති මුද්දර ඇලවිය යුතුය.

දෙවන උපලේඛනය
(4 වන වගන්තිය )

1. ස්වේච්ඡා සමාජසේවා සංවිධානයේ රීතිවල සත්‍ය පිටපතක්.
2. පිළිගත් විගණකවරයෙකු විසින් සහතික කරන ලද ශේෂ පත්‍රය ඇතුළුව අලුත් ගිණුම් ප්‍රකාශයේ පිටපතක්.
3. ඉදිරි වර්ෂය සඳහා වැඩ පිළිබඳ යෝජිත වැඩ පිළිවෙල.

10 – 934

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.